**පසුගිය කළාපයෙන්**

**ඔබගේ පියාගේ ඝාතනය වර්තමානයේ නඩත්තු කරන දේශපාලන ක්‍රමයේ නියත ප්‍රතිපලයක් කියලා හිතෙන්නේ නැත්ද?**

පැහැදිලිවම මේක පවතින දේශපාලන ක්‍රමයේ කටුක අත්දැකීමක්. මනාප ක්‍රමය නිසා තමයි මේ සියළු දේශපාලන ගැටුම් ඇතිවෙන්නේ. ඉස්සර තිබුණ ආසන ක්‍රමය තිබුණා නම් මේ තරම් භයානක දේශපාලන ගැටුම් ඇතිවෙන්නේ නෑ. ඔබ කියන්නේ මේක මනාප ක්‍රමයේ ප්‍රතිපලයක් කියලද? මම පවත්නා දේශපාලන ක්‍රමය කියලා කිව්වේ ඊට එහා ගිය අදහසකින්.

දේශපාලනයේ යෙදෙන කෙනෙක් විදිහට මම දකින්නේ ඒ විදිහට. නමුත් රටේ පුරවැසියෙකු විදිහට නම් සමස්ථ දේශපාලනයම බිස්නස් එකක්වීමේ ප්‍රතිඵලයක් විදිහට කියලා කියන්න පුළුවන්. මේ බිස්නස් එක නිසා එක පැත්තකින් දේශපාලකයා ජනතාවට වඩා ඉහළින් ඉන්න ප්‍රභූවරයෙක් වෙලා. අනෙක් පැත්තෙන් මළ ගෙවල්, මඟුල් ගෙවල් ගානේ යන ඕනේ දේටයි නැති දේටයි ඇඟිලි ගහන කිසිම වටිනාකමක් නැති පුද්ගලයෙක් බවට පත්වෙලා, මම මේ කාටවත් ඇඟිල්ල දික්කරනවා නෙවෙයි. බලන්න ඉස්සර කාලේ රාජ්‍ය නායකයා ජාතිය අමතනවා කිව්වම මිනිස්සු කොයිතරම් උනන්දුවෙන් ඒ කතාව අහන්න බලාගෙන ඉන්නවද කියලා. මොකද රාජ්‍ය නායකයා ජනතාව අමතන්නේ ඉතාම සුවිශේෂී අවස්ථාවල විතරක් නිසා. අද තත්ත්වය මොකක්ද?. උදේ ඉඳලා රෑ වෙනකම් ජනතාව අමතනවා. එතකොට කොහොමටත් වටිනාකම-ක් ඉතුරු වෙන්නේ නෑනේ. රටේ හැමදෙයක්ම දේශපාලනීකරණය වෙලා. දේශපාලනය නැතුව මොනවත්ම කරන්න බැහැ. මේ තත්ත්වය වෙනස් කළ යුතුයි කියන තැන මම ඉන්නවා.

**ඔබේ පියාගේ ඝාතනයෙන් පසුව ඇතිවුණ දේශපාලන පසුබිම තුළ ඔබට දේශපාලනයේ ඉදිරි ගමනක් යන්න ඉඩක් විවර වෙලා තියනවා. ඔබ කොහොමද ඒකෙන් ප්‍රයෝජනය ගන්නේ?**

මගේ පළමුවෙනි බලාපොරොත්තුව තමයි තාත්තගේ මරණයට යුක්තිය ඉෂ්ඨ කරගැනීම. ඒකෙන් පස්සේ මම දේශපාලනයට එන්න හිතාගෙන ඉන්නවා. ඒත් ඒ කටයුත්ත ඉවරවෙන්න කලින් මැතිවරණයක් ආවොත් බොහෝ විට මට සිද්ධවෙයි ඒකට ඉදිරිපත් වෙන්න.

ලියන්න කියලා කිව්වාම මම ලියලා තිබුණේ දේශපාලනඥවරියක් වෙන්න කියලා. මට මතකයි හැමෝම ඒක බලලා හිනාවුණා. පහුගිය නගර සභා මැතිවරණයට තරඟ කරන්න මට ලොකු වුවමනාවක් තිබුණා. මම ඒක තාත්තිට කිව්වා. තාත්ති කිව්වා ඔයාට ඕනේ නම් තරඟ කරන්න. හැබැයි ටිකක් කල්පනා කරලා බලන්න තරඟ කරන අනෙක් අයගේ තත්ත්වය මොකක්ද කියලා. දෙන්නෙක් කුඩුකාරයෝ. එක්කෙනෙක් මාල කඩන මිනිහෙක්. මම ඔයාව රට යවලා ඉගැන්නුවේ ඔය විදිහට දේශපාලනයට එන්න නෙවෙයි නම් නෙවෙයි කියලා. ඉතිං ඒ වෙනකොට තාත්තිත් දේශපාලනයේ හිටපු නිසා මම හිතුවා තවත් ටික කාලයක් ඉඳලා දේශපාලනයට එන්න. එහෙම තියෙද්දි තමයි තාත්තිගේ මරණය සිද්ධ වුණේ. ඒකෙන් මම දේශපාලනයට එන එක ඉක්මන්වීමක් වුණා විතරයි.

**එහෙම කිව්වට ඔබ රටේ සිද්ධවෙන සංවේදී දේශපාලන කාරණාවලදී ඔබගේ සහභාගිත්වයක් දකින්න ලැබිලා නෑනේ. අදටත් නෑනේ?**

මට යම් තරමක නමක් හැදිලා තිබුණට කරන්න

*හිරුණිකා එරංපිලී ප්‍රේමචන්ද්‍ර කියන්නේ අපේ රටේ දේශපාලනයට එක්වෙච්ච අලුත්ම චරිතයක්. ඇයගේ මේ දේශපාලන ආගමනය සිදුවෙන්නේ සිය පියා, භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනයවීමෙන් පසුව. පියාගේ අවමංගල උත්සවයේදී ඇය කළ කතාවෙන් මුල්වරට ජනමාධ්‍යයට පුවත් මවන්නියක බවට පත්වුණු ඈ ඉන් පසුව වරින්වර දිගින් දිගටම මේ පුවත් මැවීමේ කටයුත්තට දායක වුණා.*

අම්මා. අම්මා හැම වෙලාවෙම පීඩාවට පත්වෙලා ඉන්නවා දකින්න මම කැමති නෑ. ඒ නිසා හුගාක් කල්පනාවෙන් වැඩ කරන්න වෙලා තියනවා. ඒක තමයි මගේ තියන වීක් පොයින්ට් එක. ඒ නිසා තමයි ඔබ ඔය කියන විදිහට පේනවා ඇත්තේ.

**ඇතැම් දේශපාලන විශ්ලේෂකයන් ඔබගේ පියා හඳුන්වන්නේ 'නයිට්වරයෙක්' විදිහට. ඒ කියන්නේ සංවිධානාත්මක අපරාධ කල්ලිවලට ඒ අයගේ භාෂාවෙන්ම කතාකරන කෙනෙක් විදිහට. මේ විග්‍රහය ගැන ඔබ මොකද හිතන්නේ?**

මගේ තාත්තව මට පේනේනේ දේශපාලන විශ්ලේෂකයන්ට පේන විදිහට නෙවෙයි. මගේ තාත්ත විදිහට. නමුත් මම දේශපාලන විශ්ලේෂකයන් කියන දේවල් ප්‍රතික්ශේප කරන්නෙත් නෑ. මගේ තාත්තා බොහොම දුක් විඳලා හිරගෙවල්වල ඉඳලා ජීවිතය

# මමත් තාත්තා වගේ. හොඳට හොඳයි නරකට නරකයි..

## *හිරුණිකා එරංපිලී ප්‍රේමචන්ද්‍ර*



මොකද අර ප්‍රභාකරනුත් කියලා තියනවා කියනවනේ සිංහල මිනිස-'සුන්ට ඕනේ දෙයක් මතක තියෙන්නේ බොහොම ටික කාලයයි කියලා. බැරිවෙලාවත් හෙට දුමින්ද සිල්වා කතාකරන්න පටන් ගත්තොත් හැම කෙනෙක්ම ඒ දිහා බලනවා මිස මගේ දිහා බලන්නේ නෑ.

**ඔබ මැතිවරණයකට ඉදිරිපත් වෙන්ෙ-න් ආණ්ඩු පක්ෂයෙන්ද? විපක්ෂයෙන්ද?**

මීට මාස කීපයකට කලින් මම ශ්‍රීලංකා මහජන පක්ෂයේ සාමාජිකත්වය ලබාගත්තා. ඒත් මැතිවරණයක් ආවොත් ඉදිරිපත් වෙන්නේ මොන පක්ෂයෙන්ද කියන එක තවම මම තීරණය කරලා නෑ. මගේ දේශපාලන ගමන යන්න සුදුසු, ඊට ඉඩක් තියන පක්ෂයකින් මම ඉදිරිපත් වෙනවා.

**ඔබ පවතින දේශපාලන ක්‍රමය ප්‍රශ්ණ කරන තැනකට යන්නේ පියාගේ ඝාතනයෙන් පසුවයි. ඒ සිදුවීම නො-වන්න ඔබ තවමත් පවතින ක්‍රමය ප්‍රශ්ණ නොකරන කෙනෙක් වෙන්න ඉඩ තිබුණා. ඒ නිසා ඔබගේ දේශපාලන ගමන පටු අරමුණක් වෙනුවෙන් යන ගමනක් කියලා මම කිව්වොත් ඔබ මොකද කියන්නේ?**

මට දේශපාලනයට එන්න උවමනාවක් තිබුණේ පොඩි කාලේ ඉඳලා. ඉස්කෝලේදි ලොකු වුණාම කවුරු වෙන්නද කැමති කියලා රචනාවක්

පුළුවන් වැඩ දේවල් හරිම සීමිතයි. පහුගිය දවස්වල මම සෝභිත හාමුදුරුවන්ගේ සාදාරණ සමාජයක් වැඩපිළිවෙළට එකතුවෙලා හිටියා. එතකොට සමහරු කියන්න පටන්ගත්තා ආණ්ඩුවට විරුද්ධව වැඩ කරනවා කියලා. මම

සටහන හා ඡායාරූප
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

ගෙදරින් එළියට බැහැලා යනකොට අම්මා කියන්නේ කරදරයක් නැතුව ගෙදර එන්න ලැබෙන්න කියලා. අපි හරිම බයෙන් සැකෙන් තමයි ජීවත්වෙන්නේ. බලන්න රටේ අගවිනිසුරු-වරියට කළ දේ. එහෙම බලද්දි මම කවුද? එක වෙඩි උණ්ඩයක් මම වෙනුවෙන් වැය කරනවා කියන එක මේ අයට බොහොම සරල දෙයක්. මම මැරෙන්න බය නෑ. ඒත් මට තියන ප්‍රශ්ණය

ගොඩනගාගත් කෙනෙක්. මරණය පෙනී පෙනී ඒකෙන් ගැලවුණ කෙනෙක්. ජනතා විමුක්ති පෙරමුණ තාත්තට බෝම්බ ගහන වෙලාවේ මම ඉඳලා තියෙන්නේ තාත්තගේ ඔඩොක්කුවේ. වාසනා-වකට බෝම්බ පිපිරුවේ නෑ. ඒ හැමදේකටම මුහුණ දුන්න තාත්තා හොදට හොදයි නරකට නරකයි ජාතියේ මනුස්සයෙක් කියලා මම පිළිගන්නවා. හැබැයි
තාත්තා හොදට හොඳයි. නරකට නරකයි.

**එතකොට දුව?**

දුවත් තාත්තා වගේ වෙන්න එපැයි. විශේෂයෙන්ම කාන්තාවක් විදිහට එන ප්‍රශ්ණ පිරිමින්ට එන ප්‍රශ්ණවලට වඩා බරපතලයි. ඒ නිසා අනිවාර්යෙන්ම හොඳට හොදයි නරකට නරකයි වෙන්න වෙනවා.

**නිවාඩුවට වෙනසක්**
Villa 16 Hikkaduwa

ලංකාවේ නිවාඩු ගත කරන්නට යන ඔබට ලෝ ප්‍රකට හික්කඩුව සුන්දර මුහුදු වෙරළ පිසගෙන එන සිසිල් මන්ද මාරුතයේ පහස විඳිමින් නිවාඩු නිකේතනයක සොදුරු බව හිමි, සියළු පහසුකම් සහිත අංග සම්පූර්ණ අපූරු නිවසක විවේකයක් විනෝදයක් සමග නිවාඩු ගත කරන්නට විමසන්න.

**සනත්:** (03) 8774 2408
0422 233 009
sanathku@yahoo.com

හික්කඩුව නගර මධ්‍යයේ
මුහුදු වෙරළට ඇවිදින දුරින්
විදුලි උපකරණ සහ ගෘහ භාණ්ඩ සමගින්
Wi Fi අන්තර් ජාල පහසුකම්
අපගේ වෙබ් අඩවිය www.villa16hikkaduwa.com

**MONT ALBERT DENTISTS P/L**
For all Your Dental Requirements

We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS
FOR FAMILIES,
FREE CHECK UPS
FOR KIDS UNDER
7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)

www.montalbertdentists.com.au